58

47

මගේ අංකය : PMO/ADM/01/01/01/01

2022 මැයි මස 27 දින

සියලුම අංශ ප්‍රධානීන් වෙත,

<u>පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩලය කැඳවීම සීමා කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2022.05.25 දිනැතිව නිකුත් කර ඇති රා.ප.චි. 10/2022 සම්බන්ධයෙන් ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි. (අදාළ චක්‍රලේඛයේ පිටපතක් අමුණා ඇත.)

02. ඉහත චක්‍රලේඛයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර 2022.06.01 දින සිට 2022.08.31 දින දක්වා වූ ඉදිරි මාස තුනක කාලය සඳහා අංශය මගින් ඉටු කරනු ලබන කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාමට බාධාවක් නොවන පරිදි අත්‍යවශ්‍ය අවම නිලධරයන් පමණක් සේවයට කැඳවීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවීමට කටයුතු කළ යුතු වේ.

03. ඒ අනුව, ඇමුණුම 01 මගින් දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව ජූනි, ජූලි සහ අගෝස්තු මාසයන් සඳහා සකස් කරන ලද රාජකාරි චක්‍රය පිළිවෙළින් 2022.05.30, 2022.06.29 හා 2022.07.28 දින පාලන අංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

04. ඉහත රාජකාරි චක්‍රයට අනුව සේවයට කැඳවීමක් නොමැති දිනයක දී වුව ද සෑම නිලධරයෙකුම දුරකථන හෝ මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ රාජකාරියට අදාළ කාර්යයන් ඉටු කිරීමට බැඳී ඇති බව ද වැඩිදුරටත් අවධාරණය කරමි.

ඊ එම් එස් බී ඒකනායක
අග්‍රාමාත්‍ය ලේකම්